# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 14/2015**

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07
2015 නොවැම්බර් මස 24වැනිදා

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**U-EX I (II) හා ඉහළ වැටුප් කේත සහිත තනතුරු දරන්නන් හට**
**බ්‍රීෆ්කේස් නිකුත් කිරීම**

2011.09.01 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 964 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

2. U-EX I (II) හා ඉහළ වැටුප් කේත සහිත සියලු තනතුරු දරන්නන් වසර පහකට වරක් තමන් විසින්ම බ්‍රීෆ්කේසයක් මිලදී ගෙන ලදුපත ඉදිරිපත් කිරීම මත එක් බ්‍රීෆ්කේසයක් සඳහා රු. 5,000/- ට නොවැඩි වියදම ප්‍රතිපූරණය කර ගැනීමට හිමිකම් ලබන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

3. වසර පහක කාලය අවසන් වීමෙන් පසුව බ්‍රීෆ්කේසය නැවත භාර දීමේ අවශ්‍යතාවක් නොමැති බව ද තීරණය විය.

4. 2011.09.01 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 964 හි ප්‍රතිපාදන අනුව දැනට බ්‍රීෆ්කේස් නිකුත් කර ඇති සේවකයන්, ඔවුන් බ්‍රීෆ්කේස් ලබා ගත් දින සිට වසර 05ක් සම්පූර්ණ වන තුරු මෙම චක්‍රලේඛය ප්‍රකාරව බ්‍රීෆ්කේස් ලබා ගැනීමට හිමිකම් දරනු නොලැබේ.

5. 2011.09.01 දිනැති අංක 964 දරන කොමිෂන් සභා චක්‍රලේඛය මෙයින් අවලංගු කෙරේ.

6. මෙම චක්‍රලේඛයෙහි ප්‍රතිපාදන 2015.12.01 දින සිට ක්‍රියාත්මක වේ.

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

**අ/කළේ: මහාචාර්ය මොහාන් ද සිල්වා**
**සභාපති**

පිටපත්:
1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරුන් / සහකාර ලේඛකාධිකාරීවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

ගොනු අංකය : යූජීසී/එච්ආර්/6/1/2